බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.


5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2018

ප්‍රශ්න පත්‍ර අංක 04 - I පත්‍රය

විභාග අංකය : ..... **කාලය : පැය 1යි මිනිත්තු 15**

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


01) පහත රූප අතරින් දෙක බැගින් සම්බන්ධතාවයක් දක්වයි. එම කට්ටල තුන ඇතුළත් පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.



A **B** **C** **D** **E** **F**

(1) AB , CF, DE (2) AC , BF , DE (3) AF, BC, DE

02) පහත දක්වෙන රූප අතුරෙන් 3 ක් එකිනෙකට සම්බන්ධතාවයක් දක්වන අතර අනෙක් රූපය එසේ සම්බන්ධතාවයක් නොදක්වයි. එසේ සම්බන්ධතාවයක් නොදක්වන රූපය තෝරන්න.



A B C D

(1) B (2) D (3) C

- පහත වගන්තිවල තද කළු අකුරින් මුද්‍රිත වචනවලට පිළිවෙලින් ආදේශනය කළ හැකි වචන යුගලය අඩංගු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

03) සිසුන්ගේ මතු දවස සරු වන්නේ ගුරුවරුන්ගේ වෙර වීරිය මතය.
(1) අනාගතය, දියුණුව
(2) අනාගතය, උත්සාහය
(3) අනාගතය, බලාපොරොත්තුව

04) පැරණි නරපතියෝ වාරි කර්මාන්තයට යොමු වූහ.
(1) රජවරු, පුරාවස්තු (2) රජවරු වැව් සෑදීමට (3) රජවරු, ගොවිතැනට

- පහත වගන්තිය සම්පූර්ණ කිරීමට සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

05) කිරි කළයට ..... මුසු කළා වගෙයි.
(1) වතුර (2) සීනි (3) ගොම

06) මිටි තැනින් ..... බහිනවා වගේ
(1) වතුර (2) තලගොයින් (3) ගවයින්

07) විදුලි මීටරයක මාසය අවසානයේ සටහන් වී තිබුණේ මෙසේය.

0	1	0	0	7	1

මාසය තුළ විදුලි ඒකක 83 ක් පාවිච්චි කර තිබිණි.
මාසය ආරම්භයේ මීටරයේ සටහන්ව තිබූ සංඛ්‍යාව පහත පිළිතුරු අතරින් තෝරන්න.

(1)

0	0	9	9	8	8


(2)


0	0	9	0	9	8


(3)


0	1	0	1	5	4

08) පහත රූපවල පරිමිතිය පිළිබඳ කිව හැක්කේ,


A


B


C


D

(1) රූප තුනක් පමණක් සමාන ය. (2) සියල්ලම එක සමාන ය. (3) එකිනෙකට වෙනස් ය.

09) අභ්‍යාස පොත් 270 ක් ළමුන් 9 දෙනෙකුට සම සමව බෙදූ විට එක් අයෙකුට ලැබෙන පොත් ගණන කීයද?

(1) 30 (2) 20 (3) 25

10) එම ප්‍රමාණය ම එක් අයෙකුට ලැබෙන ලෙස පොත් 150 ක් ළමුන් කී දෙනෙක් අතරේ බෙදිය හැකිද?

(1) ළමුන් 15 (2) ළමුන් 5 (3) ළමුන් 30


11) රුපියල් 725.00 රහස් සංකේත වලින් ලියා තිබුණේ R ⊕ ○ ▽ . ☆ ☆ ලෙසය. ඒ අනුව රුපියල් 269.00 ලිවිය හැක්කේ,


(1) R ○ ▽ □ . ☆ ☆ (2) R ○ □ □ . ☆ ☆ (3) R ○ ⊕ ▽ . ☆ ☆


12) දිග 6 cm පළල 4 cm උස 3 cm සනකාභ හැඩයේ දිග දී කැබැල්ලකින් 1 cm පළල 1 cm උස 1 cm වන කුඩා ගණක කීයක් කැපිය හැකි ද?


(1) 32 (2) 72 (3) 36

13) සමචතුරස්‍රාකාර කඩදාසියක් ගෙන එම තුන් වරක් නවා එයින් පහත දක්වෙන හැඩය ඇඳ කපා ඉවත් කර දිග හැරිය විට දැකිය හැකි රූපය වන්නේ,




(1)


(2)


(3)

14) මා ළඟ ක්‍රීඩා උපකරණ කට්ටලයක් ලබා ගැනීමට රුපියල් 2900.00 ක් තිබේ. අම්මා රුපියල් 2100.00 ක් මා හට දුන්නා ය. කට්ටලයේ මිල රුපියල් 7500.00 කි. ඒ සඳහා අවශ්‍ය වන ඉතිරි මුදල කොපමණ ද?

(1) රුපියල් 4600.00 (2) රුපියල් 4800.00 (3) රුපියල් 2500.00


- දී ඇති රූප සටහන තේරුම් ගෙන 15 හා 16 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

15) පොලීසියට ඊසාන දිශාවෙන් ඇත්තේ,

(1) තැපැල්හල

(2) පන්සල

(3) පාසල



16) පන්සල ඇත්තේ පාසලට කුමන දිශාවෙන් ද?

(1) නැගෙනහිර (2) බටහිර (3) නිරිත

17) එක් වරකට බෙහෙත් පෙති 3 බැගින් දිනකට තුන් වරක් කෑමට පසු ගන්න. මෙම උපදෙස් අනුව සතියකට ගත යුතු බෙහෙත් පෙති ප්‍රමාණය කොපමණ ද?

(1) 45 (2) 63 (3) 42

18) ශාලාවක තබා ඇති කකුල් තුනේ පුටු හා කකුල් හතරේ පුටුවල කකුල් සංඛ්‍යාවේ එකතුව 36 කි. කකුල් තුනේ හා හතරේ පුටු ගණන පිළිවෙළින් දක්වූ විට,

(1) 4 , 6 (2) 6 , 4 (3) 8 , 4

- ළමුන් තිදෙනෙක් පුස්තකාලයට ගොස් පොත් කියවූ වේලාවන් පහත දක්වේ.

උදාර	පෙ.ව. 9.30 - 2.30
සුදාර	පෙ.ව. 10.00 - 12.45
මදාරා	පෙ.ව. 9.45 - 3.30


19) වැඩිම වේලාවක් පොත් කියවූයේ කවුද?

(1) උදාර (2) සුදාර (3) මදාරා

20) ඉරු දින අපර භාග 10.25 ට සිදුවූ නාය යාමේ බෙදවාචකයට ගොදුරු වී අවතැන් වූවන් ආරක්ෂිත ස්ථාන කරා යොමු කරන ලදී. මෙම සිදුවීම සිදු වී ඇත්තේ,

(1) උදෑසන 10.25 ට ය. (2) රාත්‍රී 10.25 ට ය (3) මධ්‍යාහ්නයේ දී

- මෙම රූපය ඇසුරෙන් පිළිතුරු සපයන්න.



21) මෙහි දක්වෙන ගණක සංඛ්‍යාව කොපමණ ද?

(1) 33 (2) 34 (3) 30

22) මෙය සම්පූර්ණයෙන් ම පාට කළ විට දෙපැත්තක් පමණක් පාට වී ඇති ගණක ගණන කොපමණ ද?

(1) 11 (2) 12 (3) 14

23) දී ඇති වාක්‍ය අතුරෙන් වඩාත් නිවැරදි වාක්‍ය තෝරන්න.

(1) සිරිමල් නිතර ගොළුබෙල්ලෙකු මෙන් කඩිසරව වැඩ කරයි.

(2) විභාගය අසමත් වීම ආසිරිට ඉහේ මලක් පිපුණා වගේ

(3) වත්තේ වවා තිබූ බෝග සියල්ල ගං වතුරට විනාශ වීම නිසා මාමා මුළු සේසතම විනාශ වූ බව කියමින් දුක් වේ.

24) දරුවන් ගුරුවරුන්ට වැඩිහිටියන්ට කීකරු විය යුතුය.
දරුවන්ට ගුරුවරුන්ට වැඩිහිටියන් කීකරු විය යුතුය.
දරුවන්ට ගුරුවරුන් වැඩිහිටියන් කීකරු විය යුතුය.

25) A, B, C, D යන සමචතුරස්‍ර තුළ ඇති දෙකේ ගුණාකාරවලින් සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාව කුමක් ද?

(1) 0 268 (2) 2 095 (3) 2 068

A	B
2, 3	8, 9
6, 7	0, 5
D	C

26) වරල - රවල නම් රසල - ..... යන්නට, හිස්තැනට සුදුසු පදය තෝරන්න.

(1) සරල (2) රවල (3) වරල

27) පහත වචන යොදා ගෙන නිවැරදි අර්ථයක් දෙන වගන්තියක් සෑදිය හැකි ඉලක්කම් පෙළ තෝරන්න.

1. මම 2. ජය 3. බාධක 4. බිඳ 5. ලබමි

(1) 1, 3, 4, 2, 5 (2) 1, 2, 5, 3, 4 (3) 2, 5, 1, 3, 4

28) මුලින් දී ඇති වචනයේ අදහස ප්‍රකාශ වන වචනය තෝරන්න.
වක්කඩ


(1) ගඟ මුහුදට සම්බන්ධ වන ස්ථානය

(2) ලියැද්දකින් ලියැද්දකට වතුර යාමට සකස් කළ ස්ථානය

(3) වක්ව සෑදූ කඩය

29) පහත ඔරලෝසු මුහුණතේ දක්වෙන වේලාව කැඩපතකින් බැලූ විට එහි වේලාව වන්නේ,

(1) 8.55 (2) 9.05 (3) 2.55




30) මෙම රූපයේ ඇති ත්‍රිකෝණ සංඛ්‍යාව කීයද?


(1) 9


(2) 11

(3) 13



31) පහත සංකේත භාවිත කරමින් දසුනි තම මිතුරියට පණිවුඩයක් යවන ලදී. එම පණිවුඩය පහත පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.




යන පණිවුඩයෙන් කියවෙන්නේ,

(1) නංගීත් සමඟ හෙට එන්න. (2) මල්ලීත් සමඟ හෙට උදේ එන්න.

(3) නංගීත් මල්ලීත් සමඟ හෙට උදේ යන්න.

- දී ඇති කවිය කියවා 32 හා 33 කවි වලට පිළිතුරු සපයන්න.

මව් පිය දෙදෙනව ත්
තමන් ගුරුවරයින්ට ත්
නුඹේ වරද ඇසුවොා ත්
නොා සඟවා එය කියනු යහප ත්

32) මෙම කවියෙන් කියවෙන්නේ,

(1) වරදකි. (2) දඬුවමකි. (3) උපදෙසකි.


33) කවියෙන් කියවෙන පරිදි වඩාත් සුදුසු වන්නේ කුමක් ද?

(1) මව්පියන්ට වැරදි කීමය.

(2) තම වැරැද්ද නොසඟවා දෙමාපියන්ට ගුරුවරුන්ට කීම ය.

(3) වරද සඟවා නොකීමය.

- පහත ප්‍රස්තාරයේ දැක්වෙන්නේ එක්තරා ප්‍රදේශයක එක් වර්ෂයක දී තේ, රබර්, පොල්, වී, වගා කළ බිම් ප්‍රමාණයයි.



34) රබර් වගා කළ බිම් ප්‍රමාණය අක්කර 150 ක් නම් වී වගා කළ බිම් ප්‍රමාණය අක්කර,

(1) 600 (2) 300 (3) 750

35) වගා කළ මුළු බිම් ප්‍රමාණය අක්කර,


(1) 1000 (2) 1200 (3) 600


36) තේ වගා කළ බිම් ප්‍රමාණය මුළු වගා බිමෙන් කවර භාගයක් ද?


(1) $\frac{2}{4}$ (2) $\frac{3}{8}$ (3) $\frac{1}{4}$

- රටාව අනුව අංක 37, 38 යන ප්‍රශ්නවල හිස්තැනට සුදුසු සංඛ්‍යාව තෝරන්න.

37)








(1) 16 (2) 12 (3) 19

38)



(1) 16 (2) 14 (3) 15

- පසුගිය දිනවල පැවති වැසිබර කාලගුණය සමඟ පහත් බිම් ඇතුළු බොහෝ ස්ථානවල ජලය රැඳී පවතී. එමෙන් ම ඉවතලන භාජන, පොලිතීන්, වැහි පීලිවලද ජලය රඳා පැවතීම හේතුවෙන් නැවත ඩෙංගු මදුරුවන් බෝ වීමේ අවදානමක් පවතී.

39) මෙම ඡේදය සඳහා සුදුසු ශීර්ෂ පාඨයක් වන්නේ,
(1) වැසි ජලය තැන් තැන්වල රැඳී ඇත.
(2) ඩෙංගු උවදුර යළි හිස එසවීමට ඉඩ ඇත.
(3) වැස්ස සමඟ ඩෙංගු මදුරුවන් බෝ වීම සිදු විය.

40) පහත රූපයේ ඇති සංඛ්‍යා රටාව අනුව හිස්තැනට ගැළපෙන කොටස තෝරන්න.

2	16		32
4	14		30
6			28
8		24	26

(1)

	18
12	20
10	22

(2)

	18
12	16
10	14

(3)

	18
	12
20	10
22	

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි.

5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණය 2018

ප්‍රශ්න පත්‍ර අංක 04 - II පත්‍රය

විභාග අංකය : ..... **කාලය : පැය 1යි මිනිත්තු 15**

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01) පහත ඡේදය හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට ඒ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

වරින්වර හමා ආ සුළඟ නිසා උණ පඳුරු සර සර ගායි. ඉවුර දිගේ දුව ආ සමහර කුඩා සත්තු ජබුඃ හඬින් දියට පනිති. ටික වේලාවකට පසු හඳ පායා ආවේ ය. රන් තැටියකින් කිරි ඇද හැලෙන්නා සේ සඳ රැස් ගලන්නට විය. ඒ රැසින් නිසල ගඟ දිය ද රන් පැහැ ගත්තේ ය.

- සෝමවීර සේනානායක -
ගඟ අද්දර කැලේ

(1) මෙම ඡේදය උපුටා ගන්නා ලද ග්‍රන්ථය කුමක් ද?

.....

(2) එම ග්‍රන්ථය රචනා කළේ කවුද?

.....

(3) මෙහි දැක්වෙන්නේ දවසේ කුමන වේලාවක් ගැන ද?

.....

(4) උණ පඳුරු සරසර ගෑවේ කුමක් නිසා ද?

.....

(5) තද කළු පැහැයෙන් දක්වා ඇති අකුරු දෙකෙහි ඇති පිල්ලම් දෙක නම් කරන්න.

i. පඳුරු - ..... ii. රැස් - .....

(6) මෙහි සඳහන් උපමාව තෝරා ලියන්න.

.....

(7) එහි යෙදී ඇති උපමේය කුමක් ද?

.....

(8) නිසල ගඟ දියට කුමක් සිදු වේද?

.....

(9) "වංචල" යන්නට විරුද්ධාර්ථ පදය ඡේදයෙන් තෝරා ලියන්න.

.....

(10) "කුඩා සත්තු ජබුඃ ගා දියට පනිති." යන වගන්තිය අතීත කාලයට හරවා ලියන්න.

.....

02) මෙම කවියේ පද පේළි නිවැරදිව ගළපා ඉදිරියේ ඇති හිස්තැනෙහි අනුපිළිවෙළින් අංක යොදන්න.

ඉවසන්නට පුළුවන්	නම්	(.....)
ලැබුණත් ලෝකෙන්	ගැරහුම්	(.....)
ඔබයි මගේ පුතා	උතුම්	(.....)
ඉටු කොට කළ යුතු	යුතුකම්	(.....)

03) පහත කෙටි යෙදුම් දිගු කර ලියන්න.

(1) ස.තො.ස. - .....

(2) ස.ණ.ස. - .....

.....

04) පහත ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

(1) අටුව කඩා ..... හැදුවා වගේ

(2) ..... කෝට්ටේ ගියා වගේ

05) පහත යෙදුම්වල අර්ථය තින් ඉර මත ලියන්න.

(1) අනෝරා වැස්ස - .....

(2) හෙනහුරා ලබලා - .....

06) පහත වගන්තිවල තද කළු පාටින් මුද්‍රිත යෙදුම් සඳහා තනි පද ලියන්න.

(1) මම පැරණි භාණ්ඩ ප්‍රදර්ශනයට තැන්පත් කර ඇති ස්ථානයක් නැරඹීම පිණිස ගියෙමි.

.....

(2) එය ඉතිහාසගත වටිනාකමකින් යුත් ගොඩනැඟිල්ලකි. -

.....

07) පහත වචන අතුරින් නිවැරදිව ලියා ඇති වචනය කොටුව තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

අත්‍යාවශ්‍ය / භාවිතා / ඖෂධ / උදව්ව

08) පහත දී ඇති වචන ගළපා වගන්තිය සාදා ලියන්න.

(1) නාට්‍ය / කළේ / හෙන්රි / හුණුවටය / නිර්මාණය / ජයසේන ය

.....

(2) ශිල්පමයි / මනා / උගත / රැකෙනා / මතු

.....

09) පහත දී ඇති ඉංග්‍රීසි වචන සඳහා යෙදෙන සිංහල වචන ලියන්න.

(1) teacher - .....

(2) Chalk - .....

10) දී ඇති රූපය සඳහා ඉංග්‍රීසි භාෂාවේ යෙදෙන වචනය ඉංග්‍රීසියෙන් ලියන්න.



.....

11) දී ඇති වගන්තිය සිංහලට හරවා ලියන්න.

I am sorry - .....

12) පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහල අකුරෙන් ලියන්න.

මගේ වයස අවුරුදු දහයයි - .....

13) පහත දෙමළ වගන්තියේ අර්ථය සිංහලෙන් ලියන්න.

නාංගල් තණ්ණීර් කුඩිප්පෝම් - .....

14) "මම පරිසරයට ආදරය කරමි" යන මාතෘකාව පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යක ම වචන පහකට වඩා වැඩි විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර විත්‍යාසය නිවැරදි විය යුතු ය.)

.....

.....

.....

.....

- දී ඇති හිස්තැන මත පිළිතුර ලියන්න.

15) තිස් අට දහස් දෙසිය පහ - මෙම සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.


.....

16) දී ඇති සංඛ්‍යා රටාවේ ඊළඟට එන සංඛ්‍යා දෙක ලියන්න.

(1) 84, 70, 57, 45, ... , ...

(2) 63, 72, 81, 90, ... , ...

17) රූපයේ අඳුරු කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.



.....

18) උදෑසන 6.00 ට නිවසින් පිට වූ තාත්තා 8.30 ට සිය කාර්යාලයට ගොස් 4.30 ට කාර්යාලයෙන් පිටත් වී දුම්රියෙන් නිවසට ආවේ රාත්‍රී 8.15 ට ය.

(1) තාත්තා කාර්යාලයේ ගත කළ කාලය කොපමණ ද? .....

(2) ආපසු නිවසට පැමිණි වේලාව ඩිජිටල් වේලාවෙන් දක්වන්න.

.....

19) කර්මාන්ත ශාලාවක මිනිත්තුවකට කිරි පැකට් 15 බැගින් නිපදවේ. කිරි පැකට් 180 ක් සෑදීමට ගත වූ කාලය කොපමණ ද? .....

20) මෙම සංඛ්‍යාවලින් ඉරට්ටේ සංඛ්‍යා 2 ක් එකතු කළ විට පිළිතුර 662 කි. එම සංඛ්‍යා දෙක ලියන්න.

..... , ...

257		226
	384	
278	225	113

21) දාර 6 ක් වන ඝන වස්තුවක මුහුණත් 4 කි. එම ඝන වස්තුව කුමක් ද?

.....

22) විභාග ශාලාවක එක් පේළියකට පුටු 6 බැගින් පේළි 15 ක් ද පුටු 4 බැගින් පේළි 3 ක් ද ඇත. එම ශාලාවේ ඇති පුටු ගණන කීයද? .....

23) යහළුවන් පස් දෙනෙකු උපන් දින සාදයකට යාමට එක් අයෙකු රුපියල් 450/- බැගින් එකතු කරන ලදී. තෑග්ගට වැය වූ මුදල රුපියල් දෙදහසකි. ඉතිරි මුදල යහළුවන් පස් දෙනා අතරේ නැවත බෙදා ගන්නා ලදී. එක් අයෙකුට ආපසු ලැබුණු මුදල කීයද?


.....

24) වතුර ටැංකියක් සම්පූර්ණයෙන් පිරවීමට මිනිත්තු 18 ක් ගත වේ. එවැනි ටැංකි 10 ක් එකවර පිරවීමට ගතවන කාලය කොපමණ ද? .....

25) පහත ගැටලුව විසඳා රෝම සංඛ්‍යාවලින් ලියන්න.

xiv + ix - xx = ...


26) සෑම පඩියකම උස හා පළල එක සමාන ය.



(1) ඉහත රූපයේ පරිමිතිය කොපමණ ද? .....

(2) මෙහි වර්ගඵලය කොපමණ ද? .....

27) මෙම රූපයේ ඇති චතුරස්‍ර ගණන කොපමණ ද? .....



28) පස්වන ශ්‍රේණියේ සිසුන් පාසලේ වෙළෙඳපොළක් පැවැත් විය. පහත සඳහන් ආකාරයට පලතුරු ගෙනෙන ලදී.



(1) අඹ ප්‍රමාණය 70 ක් නම් පේර කොපමණ ගෙනැවිත් තිබුණේ ද?

.....

(2) ගෙනා මුළු පලතුරු ප්‍රමාණය කොපමණ ද?

.....

29) දුම්රිය මැදිරි 5 ක මගීන් 148 ක් සිටි අතර මගීන් 26 බැස ගිය අතර තවත් 78 ක් දුම්රියට ගොඩ විය. සෑම මැදිරියක ම සමාන මගීන් සංඛ්‍යාවක් සිටින්නේ නම් එක් මැදිරියක සිටින මගීන් ගණන කොපමණ ද?

.....

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

30) ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය,

(1) බෝ (2) නා (3) නුග (4) දඹ

31) බල්ලෙක් සපා කෑ විට,

(1) තුවාලය ඇති ස්ථානය ගලා යන ජලයෙන් සේදීම

(2) තුවාලයට බෙහෙත් දැමීම.

(3) විෂ බීජ නොයන ලෙස වසා තැබීම.

(4) ප්ලාස්ටරයක් දමා වැසීම.

32) ජාතික කොඩියේ කොළ පාටින් නියෝජනය වන්නේ,

(1) මුස්ලිම් ජන වර්ගයයි. (2) දුවිඩ ජන වර්ගයයි.

(3) සිංහල ජන වර්ගයයි. (4) ආදිවාසි ජන වර්ගයයි.

33) ස්වාභාවික ආපදාවක් පිළිබඳ ප්‍රදේශයේ ජනතාව ක්ෂණිකව දැනුවත් කිරීමට හොඳ ම මාධ්‍යයකි.

(1) රූපවාහිනිය (2) ගුවන් විදුලිය

(3) දුරකථනය (4) ශබ්ද විකාශන යන්ත්‍ර

34) කමතේ දී මුත්තා ලෙස හඳුන්වන්නේ,

(1) හක් ගෙඩිය (2) කළ ගෙඩිය

(3) කමත අතුගාන ඉදල (4) පැදුර

35) මධකලපුව පිහිටි පළාත වන්නේ,

(1) උතුරු මැද (2) වයඹ (3) ඌව (4) නැගෙනහිර

36) යතුරු පැදියක ගමන් කිරීමේ දී අනතුරු අවම ගැනීමට අවශ්‍ය ම වන්නේ,


(1) ආරක්ෂිත හිස් ආවරණය පැළඳගෙන යාම. (2) දෙදෙනෙකු ගමන් නොකිරීම.

(3) අඩු ම වේගයකින් යාම. (4) තිරිංග තද කිරීම.

37) වැවක කොටසක් නොවේ.

(1) තාවුල්ල (2) වැව් බැම්ම (3) සොරොව්ව (4) කඩාඬුව

38) විදුලි බල්බයේ ඊතලයෙන් දක්වා ඇති කොටස වන්නේ,



(1) සුතිකාව

(2) රියම් අග්‍රය

(3) පිත්තල කොපුව

(4) ඝණ අග්‍රය

39) හින්දු භක්තිකයින්ගේ උත්සවයක් වන්නේ,

(1) පාස්කු (2) හජ්ජි (3) දීපවාලි (4) රාමසාන්

40) කප්පාදු කිරීමෙන් ඵලදාව වැඩිවන ශාකයක් වන්නේ,

(1) උක් ගස (2) තේක්ක ගස (3) පොල් ගස (4) තේ ගස

41) මෙම සංකේතයෙන් දැක්වෙන්නේ,



(1) ඉදිරියෙන් පාර වංගු සහිත ය.

(2) ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය

(3) ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය

(4) මාර්ග සංවර්ධන අධිකාරිය

42) ජලය මගින් ව්‍යාප්ත වන බීජයක් වන්නේ,
(1) හොර (2) පෙතෙළ (3) මොනරකුඩුම්බිය (4) කදුරු

43) පෘථිවිය තමා වටා කැරකැවීමට (භ්‍රමණයට) ගතවන කාලය,
(1) පැය 24 (2) පැය 12 (3) දින 365 (4) දින 366

44) නිවසට ම ලබාගත හැකි සේවාවක් වන්නේ,
(1) විදුලිය (2) ජලය (3) දුරකථනය (4) මේ සියල්ල ම

45) ජලයේ පමණක් ජීවත්වන සතෙකි.
(1) ඉස්සා (2) ගෙම්බා (3) ඉබ්බා (4) දිය නයා

46) ස්වාභාවිකව ම සකස් වූ රසවත් පානයකි.
(1) දෙහි (2) කුරුම්බා (3) නාරං (4) දොඩම්

47) මදුරුවන් නිසා පැතිරෙන රෝග පමණක් අඩංගු පිළිතුර වන්නේ,
(1) මැලේරියා, ඩෙංගු, විකුන් ගුන්යා, බරවා
(2) මැලේරියා, ඩෙංගු, සරම්ප, බරවා
(3) ඩෙංගු, බරවා, උණ සන්නිපාතය, නියුමෝනියාව
(4) බරවා, ඩෙංගු, මැලේරියා, පැපොල

48) ඇසෙන් පමණක් තොරතුරු ලබා ගන්නා මාධ්‍යයකි,
(1) රූපවාහිනී (2) ගුවන් විදුලිය (3) පුවත්පත (4) පරිගණකය

49) වැඩ පහසු කර ගැනීම සඳහා ක්‍රියාකරවන නිවැරදි ආකාරය නොදක්වෙන පිළිතුර තෝරන්න.
(1) කප්පිය - ඇදීම (2) වීල් බැරෝව - තල්ලු කිරීම
(3) අතකොලුව - තට්ටු කිරීම. (4) යතු කැටය - විදීමට

50) ඔලිම්පික් ධජයේ එකිනෙකට සම්බන්ධ වූ රවුම් ගණන කීයද?
(1) 3 (2) 5 (3) 6 (4) 8

51) හිරමණය මුවහත් කිරීමට ගන්නා උපකරණයකි.
(1) පීර (2) නියන (3) ඇලිස්කටුව (4) ගිනිගල

52) කොළඹ සිට මාතර දක්වා දුම්රියෙන් ගමන් කිරීමේ දී හමු වන දුම්රිය ස්ථානයක් වන්නේ,
(1) කළුතර (2) අවිස්සාවේල්ල (3) නුගේගොඩ (4) වෙයන්ගොඩ

53) කුඹල් කර්මාන්තයේ දී යොදා ගැනේ.
(1) වී බිස්ස (2) සකපෝරුව (3) මයිනහම (4) කුඹල් ගෙඩිය

54) ශරීරයේ තැවරුණු විට කසන ශාකයකි.

(1) කහඹිලියා (2) නාබිරිත්තා (3) තුත්තිරියා (4) වෙනිවැල්

55) ලන්දේසීන්ගේ මව්රට වන්නේ,

(1) ඕලන්දය (2) පෘතුගාලය (3) බ්‍රිතාන්‍ය (4) ලන්ඩනය

56) භූ විෂමතාව අනුව ශ්‍රී ලංකාව මධ්‍යයේ පිහිටි උස් බිම් කොටස හඳුන්වන්නේ,

(1) කඳු වැටිය (2) වෙරළබඩ තැන්න (3) අඹතැන්න (4) කඳුකරය


57) මෙහි දැක්වෙන තරු රටාව වන්නේ,

(1) මහ බල්ලා

(2) කුඩා වලසා

(3) එඬේරා

(4) ඔරායන්



58) පහත රූප සටහනෙන් දැක්වෙන්නේ,



(1) පිදුරුතලාගල

(2) සීගිරිය

(3) හෝර්ටන් තැන්න

(4) ශ්‍රීපාදය

59) පහත දැක්වෙන්නේ කුමන සතෙකුගේ ගමන් විලාසයක් ද?



(1) වඳුරා

(2) ගෙම්බා

(3) මකුළුවා

(4) කුඩැල්ලා